# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1818/12 – 2013 ජූලි 10 වැනි බදාදා – 2013.07.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 219 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/4/2012/D/400.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: HIK/DS/LND/INV/25.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 ජූනි මස 26 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැඳුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, හික්කඩුව.

2. **ඉඩමේ විස්තරය.**– දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බූස්ස ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/HKK/2013/113 හා 2013.05.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ ප්‍රමාණයෙන් හෙක්. 0.3975 ක් පමණ වූ ඉඩම් කැබලි 02 ට මායිම්.

01. **කැබලි අක්ෂර 'ඒ' – දිවුල්ගහ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.2091**

උතුරට: ශ්‍රී ලංකා යුධ හමුදාව හිමිකම් කියන තල්ගහවත්ත; නැගෙනහිරට: ශ්‍රී ලංකා යුධ හමුදාව හිමිකම් කියන තල්ගහවත්ත සහ කැබලි අක්ෂර බී; දකුණට: කැබලි අක්ෂර බී, ඇළ සහ හළඹ සුමනසිරි ද සිල්වා හිමිකම් කියන දිවුල්ගහ කුඹුර; බටහිරට: හළඹ සුමනසිරි ද සිල්වා හිමිකම් කියන දිවුල්ගහ කුඹුර.

02. **කැබලි අක්ෂර 'බී' – දිවුල්ගහ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.1884**

උතුරට: කැබලි අක්ෂර ඒ, ශ්‍රී ලංකා යුධ හමුදාව හිමිකම් කියන තල්ගහවත්ත සහ ගුණන්දා හන්දි රමණී දීපිකා හිමිකම් කියන තල්ගහවත්ත; නැගෙනහිරට: ශ්‍රී ලංකා යුධ හමුදාව හිමිකම් කියන තල්ගහවත්ත, ගුණන්දා හන්දි රමණී දීපිකා හිමිකම් කියන තල්ගහවත්ත, මාර්ගය (ප්‍රාදේශීය සභාව) සහ සට්ටම්බි අනුර ද සිල්වා හිමිකම් කියන දිඹුල්ගහවත්ත; දකුණට: මාර්ගය (ප්‍රාදේශීය සභාව) සහ සට්ටම්බි අනුර ද සිල්වා හිමිකම් කියන දිඹුල්ගහවත්ත සහ ඇළ; බටහිරට: ඇළ සහ කැබලි අක්ෂර ඒ.

07 – 730

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 220 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/12/2012/CEB/309.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: නුළු/3/1/8/අත්පත්/111/49.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත

සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 ජුනි මස 27 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැඳුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, නුවරඑළිය.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ. නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දිඹුල කෝරළේ සුළු කොට්ඨාසයේ, තලවකැලේ ගමේ පිහිටි නුවරඑළිය කොට්ඨාස භාර මැනුම් අධිකාරී විසින් 2013.03.22 දින පිළියෙල කරන ලද අංක NU/NWE/2013/02 දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0490 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස (01).

01. **කැබලි අක්ෂර 'ඒ' – තලවකැලේවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0490**

උතුරට: තලවකැලේවත්ත (හි.පි. 60249); නැගෙනහිරට: තලවකැලේවත්ත (හි.පි. 60249) සහ ඇළ; දකුණට: ඇළ සහ තලවකැලේවත්ත (හි.පි. 60249); බටහිරට: තලවකැලේවත්ත (හි.පි. 60249).

07 – 766

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.